# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2112/37 - 2019 පෙබරවාරි මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2019.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ශුද්ධි පත්‍රය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, 2017.10.30 දිනැති අංක 2043/3 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ 2A පිටුවේ අංක 11-678 යටතේ පළ කරන ලද නිවේදනයේ උප ලේඛනයෙහි ග්‍රාම නිලධාරි කොට්ඨාශය - අලවතුගොඩ යනුවෙන් සඳහන් වුවත්, එය ග්‍රාම නිලධාරි කොට්ඨාශය - අංක 585 බලකඩුව යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 පෙබරවාරි මස 15 වැනි දින,
අංක 35,
''ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශ යේ දීය.

5/2/1/1315

03 -755

---

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය.

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම් ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, හතරලියද්ද ජල සම්පාදන ව්‍යාපෘතියේ, මිණිගමුව ජල ගබඩා ටැංකිය හා නල මාර්ගය එළිම සඳහා ඉඩම් කොටස්

1A - G 29549 – 39 (2019/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අවශ්‍යා ඇති හෙයින්, මෙහි පහත උප ලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 පෙබරවාරි මස 15 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත, නව පාර්ලිමේන්තු පාර,
අංක 35 හි පිහිටි නගර සැලසුම්,
ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

5/2/1/1426

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 338, වැලිවිට ඉහල ගම ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ, මිණිගමුව ගමේ පිහිටි, කැබලි අක්ෂර "A" සහ කැබලි අක්ෂර "B" වශයෙන් දැක්වෙන කෝන් ගහ මුල තැන්න නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 20 ක් පමණ වන ඉඩම් කොටස් දෙක.

**01. කැබලි අක්ෂර : A**
**ඉඩමේ නම : කෝන් ගහ මුල තැන්න**
**ප්‍රමාණය : පර්චස් 05**

මායිම් :

*උතුරට* : ටී.එම්.රංබණ්ඩා හිමිකම් කියන ඉහළ ගෙදර වත්ත
*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස
*බටහිරට* : ප්‍රාදේශීය සභා පාර

**ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : 1. ඒ. ඒ. පොඩිමැණිකේ මහත්මිය**
**අංක 76 C, වැලිවිට,**
**ඉහළගම,**
**මිණිගමුව.**

**02. කැබලි අක්ෂර : B**
**ඉඩමේ නම : කෝන් ගහ මුල තැන්න**
**ප්‍රමාණය : පර්චස් 15.**

මායිම් :
*උතුරට* : ටී.එම්.රංබණ්ඩා හිමිකම් කියන ඉහළ ගෙදර වත්ත
*නැගෙනහිරට* : ජේ.එම්.එස්.කේ. ජයසේකර හිමිකම් කියන ඉඩමේ ගෙදර වත්ත
*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ඩබ්.ජී. සෙනෙවිරත්න හිමිකම් කියන කෝන්ගහමුල තැන්න
*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස

**ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් : 1. ඒ. ඒ. පොඩිමැණිකේ මහත්මිය,**
**අංක 76 C, වැලිවිට,**
**ඉහළගම,**
**මිණිගමුව.**

03-761

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.